www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා, මිලිටරිය හා ආඥාදායකත්වයේ තර්ජනය

## Obama, the military and the threat of dictatorship

**2008 දෙසැම්බර් 23**

ජාතික බුද්ධි අංශයෙහි අධ්‍යක්ෂ වශයෙන් අද්මිරාල් ඩෙනිස් බ්ලෙයාර් තෝරා ගැනීමේ දී මීලග ජනාධිපති බරක් ඔබාමා දැන් සිය කැබිනට් මන්ඩලයට මෑතක දී විශ්‍රාම ලත් තරු හතරේ හමුදා නිලධාරින් තිදෙනෙක් නම් කොට ඇත. බලයට එන ඩිමොක්‍රැටික් පරිපාලනය තුල පෙර නොවූ විරූ ආකාරයට හමුදා නිලධාරින් නියෝජනය වීම වනාහී එක්සත් ජනපද හමුදාවෙහි දේශපාලන බලය වර්ධනය වීම තුල මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන්වලට එල්ල වන බරපතල තර්ජනයකි.

1999-2000 වසරවල එක්සත් ජනපද මිලිටරියේ ශාන්තිකර කලාපීය ආඥාපතිව සිටි ඩෙනිස් බ්ලෙයාර් ඉන්දුනීසියානු හමුදාව නැගෙනහිර ටිමෝරයෙහි සිදුකල කුරිරු ජන ඝාතන මධ්‍යයේ පෙන්ටගනය ඔවුන් සමග සහයෝගී වීමට දැරූ ප්‍රයත්නයේ දී කැපීපෙනුනු අයෙකි. ක්ලින්ටන් පරිපාලනය විසින් ප්‍රකාශ කරන ලද මානව අයිතීන් පිලිබඳ ඇල්මැරුනු උත්සුකයන් මේ මගින් ප්‍රබල ලෙස නිෂේධනය කෙරුනි.

බ්ලෙයාර් තේරීමට ප්‍රථමයෙන් ඔබාමා, හිටපු නාවික හමුදා ජෙනරාල් ජේම්ස් ජෝන්ස් සිය ජාතික ආරක්ෂක උපදේශක වශයෙන් ද හමුදාවේ හිටපු ප්‍රධාන මාන්ඩලික නිලධාරී ජෙනරාල් එරික් ශින්ෂෙකි ප්‍රවීන මිලිටරි කටයුතු භාර ලේකම් වශයෙන් ද නම් කලේ ය. මධ්‍යම ඔත්තු සේවය හෙවත් සීඅයිඒහි අධ්‍යක්ෂ වශයෙන් තවදුරටත් කටයුතු කරන ලෙස එලඹෙන පරිපාලනය ගුවන් හමුදා ජෙනරාල් මයිකල් හේඩ්න්ගෙන් ඉල්ලා සිටීමට ඉඩ ඇතැයි ද වාර්තාවේ.

පාලන තන්ත්‍රය තුල හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මේ අන්දමට එක්තැන් කිරීම ''ඩිමොක්‍රැටික් දේශපාලන තන්ත්‍රය තුල අසාමාන්‍ය ප්‍රවනතාවයකැයි ද දේශපාලන කඳවුරු දෙකම මවිතයට පත් කල එකකැයි ද'' පසු ගිය සෙනසුරාදා වොෂින්ටන් පෝස්ට් පුවත්පත වාර්තා කලේ ය.

මේ පත්වීම් කර ඇත්තේ බුෂ්ගේ ආරක්ෂක ලේකම් වන රොබට් ගේට්ස් තව දුරටත් පෙන්ටගනයෙහි එම තනතුරෙහි රැඳී සිටිනු ඇතැයි නිවේදනය කිරීමෙන් පසුව ය. ඇමරිකාව ගෙන යන ආක්‍රමනකාරී යුද්ධ අඛන්ඩව පවත්වාගෙන යෑම හා හමුදාවේ දැවැන්ත බලය බාධාවකින් තොරව පවත්වා ගෙන යෑම සහතික කිරීම සඳහා පෙන්ටගනයෙහි ''බහු සංක්‍රමනීය කන්ඩායම්'' ක්‍රියාකාරී වෙමින් සිටිති.

''දේශීය සමෘධියත් බාහිර සාමයත් සහතික කිරීම සඳහා මෙම ග්‍රහලෝකය මත වඩාත්ම ශක්තිමත් හමුදාව අප නඩත්තු කල යුතු ය. යන විශ්වාසය අප සියලු දෙනාම තුල ඇතැ''යි කියා සිටිමින් පෙන්ටගනය කෙරේ ඇති සිය යටහත් පහත් බව මේ මස මුල දී ඔබාමා ප්‍රකාශයට පත් කලේ ය. මේ අරමුනු ඉටු කර ගැනීම සඳහා එක්සත් ජනපදයේ පාබල හමුදාවන්ගේ ප්‍රමානය සොල්දාදුවන් හා නාවික භටයන් 100,000 කින් වැඩි කිරීමට ඔහු ප්‍රතිඥා දී ඇති අතර ඉහල නගින අයවැය හිඟයන්ගේ හා උග්‍ර වන මූල්‍ය අර්බුදය හමුවේ වාර්ෂිකව ඩොලර් බිලියන 850ක් පමන ගිල දමන මිලිටරි ප්‍රතිපාදනයන්ගෙන් සැලකිය යුතු පරිදි කපා හැරීම් සිදු නොකරනු ඇතැයි ද ඔහු ප්‍රකාශ කලේ ය.

තමන් වටා ඉහල හමුදා නිලධාරින් යොදවා ගැනීමට ඔබාමා ගත් තීරනය තුල හා ඔහු ''අපගේ හමුදාවන්ට සහාය දක්වන බව'' දැකගන්නා බවට සහතික වීම තුල දේශපාලන ගනන් බැලීමක වැදගත් අංගයක් ගැබ්ව ඇති බවට සැකයක් නැත. සැබැවින් ම, අවසාන ඩිමොක්‍රැටික් පාලන තන්ත්‍රයන් පිලිබඳ ආසන්න අත්දැකීම ද ඔවුනට ඇත. හමුදාව තුල සම ලිංගිකයින් පිලිබඳව තහනම ඉවත් කිරීම සඳහා ක්ලින්ටන් විසින් ගෙන එන ලද යෝජනාව මත හමුදා අධිකාරය සමග ඇතිවූ ගැටුම තුලින් ඔහුගේ පලමුවැනි ජනාධිපති නිල කාලය ඇනහිටීමට ආසන්න තත්වයකට පත්වුනි. පලමු ජනාධිපති නිල කාලයේ ඉතිරි කොටස තුල අධිකාරයේ බොහෝ දෙනෙක් ඔහුට සලකන ලද්දේ විවෘත ආඥාවකින් හෝ යන්තමින් සැඟවුනු අවඥාවකිනි.

ඉරාකයෙහි හා ඇෆ්ගනිස්ථානයෙහි යුද්ධවලින් හමුදා මත ඇති කරන විනාශකාරී ප්‍රතිඵල හා මේ රටවල් තුල එක්සත් ජනපද මෙහෙයුම්වල අසාර්ථකත්වයන් වනාහී සිවිල් බලධාරින්, ජනමාධ්‍ය හා ඇමරිකානු ජනතාව ම ''පිටුපස සිට පිහියෙන් ඇනීමක'' ප්‍රතිඵලය බවට මිලිටරි අධිකාරය තුල වර්ධනය වන උන්මාදනීය මනෝභාවය පිලිබඳ වාර්තා සැලකිල්ලට ගත් විට, ඔබාමා යටතේ ඊටත් වඩා අප්‍රසන්න ගැටුමක් ඇතිවීමේ අනතුර බොහෝ දුරට සිදුවිය හැකි දෙයකි.

එහෙත් ක්ලින්ටන්ගේ අත්දැකීම හා අද දින හමුදාව ඉදිරියේ ඔබාමාගේ හිස නැමීම යන කරුනු දෙකටම පාදක වූ වඩාත් මූලික ක්‍රියාවලියක් ඇත. එනම් දැවැන්ත ලෙස වර්ධනය වූ ''මිලිටරි කර්මාන්ත ජාලයෙහි'' බලයයි. මිලිටරි බලයේ වර්ධනයට එරෙහි වීම අඩ සියවසක්ම තරම් කාලයකට පෙර ජනාධිපති ඩ්වයිට් අයිසන්හවර් අනතුරු ඇඟවී ය. මුලු සීතල යුදසමය තුල ම අඛන්ඩව වර්ධනවූ මිලිටරි යාන්ත්‍රනය පිලිබඳ බිය පලකරමින් ඔහු එසේ අනතුරු අඟවා තිබුනි.

ඊනියා ''ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධය'' පැවති පසුගිය වසර හතක කාලය තුල හමුදාවට සැපයෙන අරමුදල් ඉමහත් ලෙස ඉහල යැමත් සමග ම මේ බල ව්‍යාප්තිය ද වර්ධනය විය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයෙහි ගෝලීය ආර්ථික තත්වයෙහි පිරිහීමේ අඩුව පිරිමැසීම සඳහා යොදාගන්නා මාධ්‍යයන් ලෙස මිලිටරිවාදය මත එය වැඩිවැඩියෙන් රඳපැවැත්ම සමග එකට වෙලී ඇති දුර්දාන්ත අංගයන් ද ඒ සමග ම වැඩිවී ඇත.

සෙන්ට්කොම්, පැකොම්, සවුත්කොම් හා නව ඇෆ්රිකොම් යන පෙන්ටගනයෙහි කලාපීය හමුදා මෙහෙයුම් ආඥාපතීන් ලෝක ගෝලය වටා එක්සත් ජනපද අවශ්‍යතාවන් හා බලය වෙනුවෙන් පෙනී සිටි තානාපතිවරුන්ගේ හා සිවිල් නිලධාරින්ගේ තැන බොහෝ දුරට අත්පත් කරගෙන ඇත.

මේ අතර ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ යුද්ධ දෙකෙහි දී ම සමස්ත ජනතාවන් කෙරෙහි ම අසීමිත බලයක් සහිත යටත් විජිත ශෛලියේ පාලන තන්ත්‍රයන් ක්‍රියාත්මක කිරීමේ කටයුතු හමුදා නායකයන් වෙත පවරා දෙන ලදී.

අවසාන වශයෙන් හමුදා අධිකරනයන් හා ගුවන්තනාමෝ බේ වැනි හමුදා සිරකඳවුරු පිහිටුවීමත් සමග එක්සත් ජනපද ව්‍යවස්ථාවෙහි නියාමයන් යටතේ ක්‍රියාත්මක වන සිවිල් උසාවිවලට ඓතිහාසික වශයෙන් පවරන ලද කාර්යයන් හමුදාව බලයෙන් අත්පත් කර ගෙන ඇත.

මෙම ඉතා වැදගත් වෙනස්කම් සිදු වී ඇත්තේ හමුදාව හා විශේෂයෙන් ම එහි නිලධාරී බල ඇනිය සිවිල් සමාජයෙන් බිඳී වෙන්වෙන තත්වයක් තුල හා පොදුවේ රිපබ්ලිකන් පක්ෂය දේශපාලනය හා විශේෂයෙන් ස්ටැලින්වාදී කිතු දහමේ පිලිගැනීම් ඒවා තුල ආධිපත්‍යය දරන තත්වයක් තුල ය. ''වෘත්තීය'' හා ''ස්වෙච්චා'' බලකායන් වශයෙන් අනිවාර්ය සේවයට බඳවාගන්නා ලද අයගෙන් හා ''පුරවැසි සොල්දාදුවන්ගෙන්'' සමන්විත කලින් පරම්පරාවල හමුදාවන්ට දැනුනු පොදු ජනතාවගේ බලපෑමෙන් එය වඩාත් පිටස්තරවී ඇත.

එහි මිලිටේරි යාන්ත්‍රනයේ වැඩෙන ආධිපත්‍යය සම්බන්ධයෙන් බුෂ් පරිපාලනයේ හිටපු රාජ්‍ය සහකාර ලේකම්වරයෙකු වූ තෝමස් සෙක්වේ විසින් අසාමාන්‍ය හා එකඑල්ලේ ඉදිරිපත් කරන මත ප්‍රකාශයක් 21 වෙනි දින වොෂිංටන් පෝස්ට් පුවත්පත පලකලේ ය.

''අපගේ ව්‍යවස්ථාව අවදානමේ'' යයි සෙක්වේ ලිපිය හිටපු ජෝෂ්ඨ නිලධාරීන් පෙරනොවූ විරූ සංඛ්‍යාවක් ඔබාමාගේ කැබිනට් මන්ඩලයට උසස් කිරීම තුලින් බොහෝ ඇමරිකානුවන්ගේ හා ජනමාධ්‍යයෙහි දර්ශන පථයට හසු නොවන පරිදි ක්‍රමයෙන් වර්ධනය වන නිහඬ මිලිටේරි කුමන්ත්‍රනය සම්පූර්න කිරීමට '' හැකි වනු ඇතැයි ඔහු අනතුරු ඇඟවී ය.

සෙක්වේ, ඇෆ්ගනිස්ථානයෙහි මත්ද්‍රව්‍ය නාශක කටයුතු පිලිබඳ තානාපතිවරයෙකු වශයෙන් සේවය කලේ ය. ඉන් පසුව, ඔහු රාජ්‍ය දෙපාර්තමේන්තුවෙහි ජාත්‍යන්තර නීති ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂනය කලේ ය. ''එක්සත් ජනපද ආන්ඩුවෙන් වැඩි කොටසක බලය යථා වශයෙන් මිලිටේරිය විසින් නිහඬව පවරා ගැනීම එකඑල්ලේ ම තමාට දැකගත හැකි වූ'' බව ද ඉරාකයෙහි හා ඇෆ්ගනිස්ථානයෙහි එය, ''න්‍යෂ්ටික වශයෙන් යුද්ධයෙහි අත්‍යවශ්‍යයන් මත සාධාරනීකරනය කෙරුනු'' බව ද ඔහු කියා සිටියේ ය.

රටින් පිට ඇරඹුනු දෙය රට තුලට ඇතුලුවෙමින් තිබෙන බව ඔහු අවධාරනය කලේය. ''2011 වසර වන විට අපගේ දේශ සීමාව ඇතුලත එක්සත් ජනපද සොල්දාදුවන් 20000ක් යෙදවීමට පෙන්ටගනය දැන් සැලසුම් සකස් කොට ඇත. ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට හෝ අනිකුත් විශාල හදිසි විපත්තිවල දී ක්‍රියාත්මක වෙමින් රාජ්‍ය හා ප්‍රාදේශීය නිලධාරීන්ට සහාය වීම සඳහා මෙය සිදුවන බව මතුපිටින් පෙනෙන්නට තිබේ. මෙම මෙහෙවර ත්‍රස්තවාදයට එරෙහි හදිසි ක්‍රියාන්විතයන්ගෙන් ඔබ්බට, දේශසීමා මුර සංචාර, රහස් තොරතුරු රැස්කිරීම, හා නීති ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම්වලට පහසුවෙන්ම පිටාර ගැලිය හැකි'' යයි ඔහු අනතුරු ඇඟවී ය.

පෙන්ටගනය තමන්ගේ ම ''සංක්‍රාන්තිය'' සූදානම් කරන බවත් මැතිවරනයෙන් ඉක්බිති සති කිහිපයක් යන විට පසුගිය මාසයේ දී එක්සත් ජනපද මිලිටරි විද්‍යාලය විසින් පල කරන ලද සඟරාවක පලවූ වාර්තාවකින් පෙන්නුම් කෙරිනි. මේ ක්‍රියාවලිය මෙහෙයවනු ලබන්නේ ඔබාමා විසින් දෙන ද ''වෙනසක්'' පිලිබඳව අනිශ්චිත පොරොන්දු මගින් නොව පවත්නා පර්යායෙහි ඓතිහාසික අර්බුදයක් තුල රට අභ්‍යන්තරයෙහි සමාජ අරගල මැඬීම සඳහා සන්නද්ධ බලය යෙදීම අවශ්‍ය වියහැකි යයි දැක ගන්නා මිලිටරි අධිකාරය මඟින් ය.

''නොදන්නා දේ ගැන දන්නා වූ'' ආරක්ෂක උපාය වර්ධනයෙහි අසම්ප්‍රදායික උපායික කම්පන'' යන හිසින් යුත් නිබන්ධනය ඉදිරිපත් කරන ලද්දේ නාදන් ෆ්‍රයර් විසිනි. ඔහු මෑතකදී විශ්‍රාම ලත් හමුදා ලුතිනන් කර්නල්වරයෙක් වන අතර අපේක්ෂිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ස්ථාපිත කර ඇති ප්‍රධාන හමුදා පුහුනු ආයතනය වන හමුදා විද්‍යාලයෙහි මහාචාර්යවරයෙකි. සඟරාවට අනුව, ඔහු ''ආරක්ෂක හා රැකවල් ප්‍රතිපත්ති සම්පාදක හා විශ්ලේෂන ප්‍රජාවන්හි ප්‍රමුඛ ක්‍රියාකාරින්ට විශේෂඥ උපදෙස් සපයමින් සිටියි.''

''අනපේක්ෂිත ආර්ථික බිඳ වැටීමක්'' හෝ ''දේශපාලන හා නීති පද්ධතිය අකර්මන්‍යවීමක්'' තුලින් ගිනි ඇවිලවිය හැකි එක්සත් ජනපදයේ ''ප්‍රචන්ඩ මූලෝපායික විසංධිවීමක්'' සඳහා එක්සත් ජනපද මිලිටරිය සූදානම් විය යුතුයයි ෆ්‍රයර් කරන අවධාරනය එක් ප්‍රමුඛ පෙර සූදානමකි.

ඔහු මෙසේ ලියයිඃ මෙවැනි සිද්ධීන් ප්‍රාදේශීය, ප්‍රාන්ත රාජ්‍ය හා ජාතික මට්ටමේ බලධාරින්ට එරෙහිව සංවිධිත ප්‍රචන්ඩතාව ඇති කරන තාක් දුරට හා පොදු විනය ප්‍රකෘතිමත් කිරීම හා ජීවාට ගොදුරු විය හැකි ජනතාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රාදේශීය හා ප්‍රාන්ත රාජ්‍ය මට්ටමේ බලධාරින්ට හැකියාවක් නොමැති වන තාක් දුරට, ඒ හිඩස පිරවීම සඳහා ආරක්ෂක දෙපාර්තමේන්තුව හෙවත් ඩීඕඩීය අවශ්‍ය වනු ඇත.''

ෆ්‍රයර් තව දුරටත් මෙසේ කියා සිටීඃ ''එක්සත් ජනපදය තුල පුලුල් ලෙස පැතිරුනු සිවිල් ප්‍රචන්ඩත්වය, අත්‍යවශ්‍ය දේශීය විනය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමුඛතා අන්තයතාව අලුත් යොමු කිරීමක් සඳහා ආරක්ෂක සංස්ථාපිතයට බල කෙරෙනු ඇත... දිගු කලක සිට සුරක්ෂිතව පවතින දේශීය විනයක් තුලින් ස්වයංතෘප්තියට පත්වී සිටින ඇමරිකානු ආන්ඩුවකට සහ ආරක්ෂක සංස්ථාපිතයකට, රට තුල වේගයෙන් ව්‍යාප්තවන මානව අනාරක්ෂිත භාවයට මුහුන දීම සඳහා, එහි බාහිර සුරක්ෂිතභාවය වෙනුවෙන් කරන ලද කැපවීම් සමහරක් හෝ බොහොමයක් ඉවත ලෑමට බල කෙරෙනු ඇත.''

වෙනත් වචනවලින් කිවහොත්, දිගහැරෙන ධනේශ්වර අර්බුදයේ උත්සන්න වීමට සම්පාත වෙමින් එක්සත් ජනපද තුල ම පන්ති අරගලය හා සමාජ විප්ලවය පැන නැගීම තුලින් යුද මෙහෙයුම්වල යෙදී සිටින හමුදාවන් ඇමරිකානු කම්කරුවන්ට එරෙහිව මෙහෙයවීම සඳහා ඉරාකයෙන් හා ඇෆ්ගනිස්ථානයෙන් ආපසු කැඳවීමට පෙන්ටගනයට බල කෙරෙනු ඇත.

දී ඇති එවන් තත්වයන් යටතේ, ඔහු තව දුරටත් මෙසේ ලියයිඃ ''රට තුල නිසංසලතාවට එල්ල වන ප්‍රචන්ඩ තර්ජන මෙල්ල කිරීමට හෝ සමනය කිරීම සඳහා සිවිල් බලධාරින් සතුව ඇති පුලුල් සම්පත් උපයෝගි කරගැනීමට පවතින තත්වයන් තුල ආරක්ෂක දෙපාර්තමේන්තුවට බල කෙරෙනු ඇත. වඩාත් ආන්තික තත්වයන් යටතේ, එක්සත් ජනපදය තුලම සතුරු කන්ඩායම්වලට එරෙහිව මිලිටරි බලය යෙදවීම ද මෙයට අන්තර්ගත විය හැකි ය. තවද, ප්‍රාන්ත රාජ්‍ය ගනනාවක හෝ මුලු රටම වෙලාගත් සිවිල් ගැටුමක් හෝ කලබැගෑනියක් තුල දේශපාලන අධිකාරිය අඛන්ඩව පවත්වා ගෙන යෑම සඳහා ආරක්ෂක දෙපාර්තමේන්තුව අවශ්‍යයෙන්ම තිබිය යුතු බලසංස්ථාවක් බවට පත්වනු ඇත.''

''අධිකාරිය අඛන්ඩව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍යයෙන්ම තිබිය යුතු බල සංස්ථාව'' යන මේ අමුතු වැකිය වනාහී මිලිටරි ආඥාදායකත්වය වහෙන්ඔරෝ බසින් පැවසීමකි.

ඔහු සිය ලිපියෙහි මෙම කොටස මෙවැනි සඳහනකින් අවසන් කරයි. ''විදේශයන්හි ස්ථාවරත්වය තහවුරු කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක දෙපාර්තමේන්තුව දැනටමත් අභියෝගයකට මුහුන දී සිටී. රට අභ්‍යන්තරයෙහි දැවැන්ත පරිමානයකින් එවැනි තත්වයක් පැන නැගීමේ අභියෝගය පරිකල්පනය කරන්න.''

මෙම කරුන අපි හොඳින් අවබෝධ කරගෙන සිටිමු. ඉරාකය හා ඇෆ්ගනිස්ථානය තුල ප්‍රතිරෝධය මැඩ පැවැත්වීමට හා විනය ඇති කිරීමට අසමත් වී ඇති තත්වයක් තුල දී එක්සත් ජනපදය තුල ම වාඩි ලා ගැනීමක් ජයග්‍රහනය කිරීමට මිලිටරියට ඇති බලාපොරොත්තුව කවරක් විය හැකි ද?

පෙන්ටගනයෙහි යුද්ධෝපක්‍රම සැලසුම්කරුවන් මෙම ප්‍රශ්න නැගීම අතිශය බරපතල ලෙස සැලකිල්ලට ගත යුතුය. එක්සත් ජනපද ධනේශ්වර රාජ්‍යයෙහි මිලිටරි ආඥාපතියෝ වර්තමාන අර්බුදයෙන් විප්ලවය සඳහා කොන්දේසි නිර්මානය කරන බව කල්තියා දැක ඒ අනුව සූදානම් වෙමින් සිටිති.

**බිල් වෑන් ඕකන්**

© www.wsws.org